මාගේ අංකය 030/3/7
නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය,
රිදිබැඳිඇළ ව්‍යාපාරය,
නිකවැරටිය.
2019.05.16

රිදිබැඳි ඇළ ව්‍යාපාරයේ
ව්‍යාපාර කමිටුවේ සියළු කමිටු සාමාජිකයින් වෙත

**ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම - රිදිබැඳිඇළ මහා වාරි ව්‍යාපාරය**

ව්‍යපාර කළමනාකරණ කමිටුව - 2019 මැයි
දිනය හා වේලාව - 2019.05.16 පෙ.ව.9.30
ස්ථානය - නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය
සහභාගිත්වය - 29

| අනු අංකය | නම | තනතුර/ආයතනය |
|---|---|---|
| 01. | ආර්.එම් රාජරත්න මහතා | නේවාසික ව්‍යාපාර කළමණාකරු - රිදිබැඳිඇල |
| 02. | ඩී.එම්. පියදාස මහතා | ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු -නිකවැරටිය |
| 03. | ජී.කේ.ජී.ඊ චන්ද්‍රසේන මහතා | ඉංජිනේරු සහකාර- ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය - නිකවැරටිය |
| 04. | ආර්.ඩී.එස්.කේ.රාජපක්ෂ මහතා | ආයතන සංවර්ධන නිළධාරී- නේවාසික ව්‍යාපාර කර්යාලය - රිදිබැඳිඇල |
| 05. | එච්.එම්. සුධර්මා කුමාරි මිය | සංවර්ධන නිළධාරි - නේවාසික ව්‍යාපාර කර්යාලය - රිදිබැඳිඇල |
| 06. | ආර්.එම් සන්ධ්‍යා කුමාරි මිය | සංවර්ධන නිළධාරි - නේවාසික ව්‍යාපාර කර්යාලය - රිදිබැඳිඇල |
| 07. | ජී.පී.එස්.පෙරේරා මිය | සංවර්ධන නිළධාරි - නේවාසික ව්‍යාපාර කර්යාලය - රිදිබැඳිඇල |
| 08. | එස්.ඩී.එන්. ඒකනායක මිය | සංවර්ධන නිළධාරි - නේවාසික ව්‍යාපාර කර්යාලය - රිදිබැඳිඇල |
| 09. | ඒ.ව් අමරසේකර මිය | ඉංජිනේරු සහකාර- ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය - නිකවැරටිය |
| 10. | එච්.එම් නිශාන්ති හේරත් මිය | සංවර්ධන නිළධාරි- ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය - නිකවැරටිය |
| 11. | එච්.එම්.ආර් වත්සලා මිය | සංවර්ධන සහකාර- ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය - නිකවැරටිය |
| 12. | අයි.බී.වී.එන්. විරකෝන් මිය | සංවර්ධන නිළධාරි- ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය - නිකවැරටිය |
| 13. | එච්.ඒ.එස්.කේ හෙට්ටි ආරච්චි මිය | සංවර්ධන නිළධාරි- ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - නිකවැරටිය |
| 14. | ටී.එම්.එම්.ආර් බණ්ඩාරනායක මහතා | කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර-ගො.සේ.ම. නිකවැරටිය |
| 15. | ඊ.එම් තිලකරත්න මයා | ගරු භාණ්ඩාගාරික - ඉබ්බාවල ගොවිසංවිධානය |
| 16. | එච්.එම් රත්නතිලක හේරත් මයා | ගරු ලේකම් - හීලොගම ගොවිසංවිධානය |
| 17. | ටී.එම්.ජී.බී තෙන්නකෝන් මයා | ගරු භාණ්ඩාගාරික - මැදඇල ගොවිසංවිධානය |
| 18. | ආර්.එම් ලයනල් රත්නායක මයා | ගරු සභාපති - තරණගොල්ල ගොවිසංවිධානය |
| 19. | එම්.එම්.කේ මාරසිංහ මිය | ගරු ලේකම් - කැබැල්ලෑව ගොවිසංවිධානය |
| 20. | එම්.ඒ.බී.සෙනරත් බංඩාර මයා | ගරු සභාපති - කිරිදිගල්ල ගොවිසංවිධානය |
| 21. | ඒ.එම්.පියදාස මයා | ගරු ලේකම් - දණ්ඩුවාව ගොවිසංවිධානය |
| 22. | එල්.එච් කපුරුබණ්ඩා මයා | ගරු සභාපති - ඕ/දිවුල්ලෑව ගොවිසංවිධානය |
| 23. | ඩී.එම්.දයාරත්න මයා | ගරු සභාපති - දිවුල්ලෑව ගොවිසංවිධානය |
| 24. | ආර්.ඩී.එන්.ශාන්ත මයා | ගරු උප ලේකම් - ඉබ්බාවල ගොවිසංවිධානය |
| 25. | එච්.එම්.යසවිමල මයා | ගරු සභාපති - මාගල්ලේගම ගොවිසංවිධානය |
| 26. | එස්.තමාල්දීන් මයා | නම්මුවාව ගොවි සංවිධානය |
| 27. | ජේ.නයිට්ටුදීන් මයා | නම්මුවාව ගොවි සංවිධානය |
| 28. | ඩී.එම්.ආනන්ද බංඩාර මයා | ගරු සභාපති - නීරාලියැද්ද මහසෙන් ගොවි සංවිධානය |
| 29. | එස්.එන්.එම් රංබණ්ඩා මයා | ගරු භාණ්ඩාගාරික - හීලොගම ගොවිසංවිධානය |

චාරිත්‍රානුකූලව ආගම සිහිකිරීමෙන් අනතුරුව ව්‍යාපාර කමිටු රැස්වීමට පැමිණි සියලු රාජ්‍ය නිලධාරීන් හා ගොවි සංවිධාන නිලධාරීන් නේවාසික ව්‍යාපාර කළමණාකාරතුමා විසින් පිළිගන්නා ලදි.

**<u>අරමුණු පැහැදිලි කිරීම</u>**

2019 මැයි මාසයට අදාල ව්‍යාපාර කමිටුවේ ආයතන සංවර්ධන ප්‍රගතිය පිලිබඳව සාකච්ඡා කිරීමත්, ගොවි සංවිධාන බල ප්‍රදේශවල පවතින මෙහෙයුම් නඩත්තු සම්බන්දව සාකච්ඡා කිරීමටත් නියමිත බව පැහැදිලි කරන ලදි. යල කන්නයේ වගා කටයුතු පිළිබඳ සාකච්ඡා කිරීමත් නියමිත බව පෙන්වා දෙන ලදි.

**<u>නේවාසික ව්‍යාපාර කළමණාකරු</u>**

2019/04/23 දින පැවති කමිටු රැස්වීමට ඉදිරිපත්කල ගැටළු හා ප්‍රගතිය-

| ඉදිරිපත් කල අය | ගැටළුව | තීරණය/ විසඳුම | වගකීම | කාලය |
|---|---|---|---|---|
| තරණගොල්ල ගොවි සංවිධානය | 47 කෙත් ඇලේ කෘෂි පාර ලබා ගැනීම සම්බන්ද ගැටළුව | එම ගැටළුව විසදන ලදි. අදාල ගොවි මහතුන් පාර ලබා දීමට කැමැත්ත ප්‍රකාශ කරන ලදී | වා: දෙ:<br>ගොවි: සං:<br>නේ: ව්‍ය:කා: | සති: 1 |
| තරණගොල්ල ගොවි සංවිධානය | 32 කෙත් ඇලේ ගැටළුව ව්‍යාපාරයේ පැවති ඇලක් නොව පසුව දීර්ඝ කල ඇලක් වන අතර එයින් ජලය ලබා ගැනීම සම්බන්ධ ගැටළුව | 32 කෙත් ඇල ගැටළුව පරීක්ෂා කරන ලද අතර එම ගැටළුව සඳහා විසඳුම් ලබා දුන්නත් පසුව එම විසඳුම පිළිබඳව එක් පාර්ශවයක් විසින් අකමැති බව ප්‍රකාශ කර ප්‍රාදේශීය ලේකම් වෙත එම ගැටළුව යොමුකර ඇත. | ඡන්:ව්‍ය:කා:<br>වා: දෙ: | සති: 1 |
| බලගොල්ලාගම ගොවි සංවිධානය | 7 කෙත් ඇල කඩාගෙන යාම සම්බන්ධව ඉදිරිපත් කල ගැටළුව | තාවකාලික විසඳුමක් ලෙස පස් පුරවා සකස් කර දෙන ලදි. | වා: දෙ: | සති: 1 |
| තරණගොල්ල ගොවි සංවිධානය | 42 කෙත් ඇල මාර්ගය අබලන් වීම සම්බන්ධ ගැටළුව | බොරළු දමා පාර සකස් කිරීම වාරිමාර්ග දෙපාර්තමේන්තුව JCB යන්ත්‍රය ලබා දී අවශ්‍ය කටයුතු සිදු කිරීම හා පස් ගැනිමට ස්ථානයක් නොමැති බැවින් JCB යන්ත්‍රය අලුත්වැඩියාව සිදු කිරීම නිසා ගැටළුව විසදාගෙන නැත. | වා: දෙ: | සති: 1 |
| කිරිදිගල්ල ගොවි සංවිධානය | ජලය ලබා ගැනීමට නොහැකි කුඹුරු සඳහා උස්සාන ජල ව්‍යාපෘතියක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කරන ලදි. | උස්සාන ජල ව්‍යාපෘතියක් ස්ථානය පරීක්ෂා කර උස්සාන ජල ව්‍යාපෘතියක් ලබා දීමට හැකියාව ඇත්නම් ලබා දීමට තීරණය කරන ලදි. | වා: දෙ: | සති: 1 |

**ආයතන සංවර්ධන ප්‍රගතිය**

| ගොවිසංවිධානය | මාසික කමිටු රැස්වීම් පැවැත්වීම. | මාසික මුදල් සාරාංශ ලැබීම | වෙනත් වැඩසටහන් |
|---|---|---|---|
| බලගොල්ලාගම | ✓ | ✓ | ලෝක ජල දිනය වෙනුවෙන් මහ සභා දැනුවත් කිරීම. |
| බුදුමුත්තාව | ✓ | ✓ | |
| කැබැල්ලෑව | ✓ | ✓ | ලෝක ජල දිනය වෙනුවෙන් 42 කෙත් ඇල ශ්‍රමදාන පැවැත්වීම. |
| හීලෝගම | ✓ | ✓ | |
| දිවුල්ලෑව | ✓ | ✓ | |
| දණ්ඩුවාව | ✓ | ✓ | |
| තරණගොල්ල | ✓ | ✓ | |
| මැදඇල | ✓ | ✓ | |
| ඉබ්බාවල | ✓ | ✓ | ලෝක ජල දිනය වෙනුවෙන් කෙත් ඇල ශ්‍රමදාන පැවැත්වීම. |
| මාගල්ලේගම | ✓ - | ✓ | ලෝක ජල දිනය වෙනුවෙන් 12 කෙත් ඇල ශ්‍රමදාන පැවැත්වීම. |
| කටගමුව | ✓ | ✓ | ලෝක ජල දිනය වෙනුවෙන් මහ සභා දැනුවත් කිරීම. |
| මාහුල් මහසෙන් | ✓ | ✓ | |
| ඕතොට දිවුල්ලෑව | ✓ | ✓ | |
| කිරිඳිගල්ල | ✓ - | ✓ | කිරි ඉතිරුම් මංගල්‍යක් පැවැත්වීම. |

**නිළවරණ මහ සභා පැවැත්වීම-**

- ❖ බලගොල්ලාගම ගොවි සංවිධානය
- ❖ මැද ඇල ගොවි සංවිධානය
- ❖ ඉබ්බාවල ගොවි සංවිධානය
- ❖ මාගල්ලේගම ගොවි සංවිධානය

**. ගොවි සංවිධාන අරමුදලින් වගා ණය ලබාදීම-**

- ❖ ඉබ්බාවල පුද්ගලයන් 55ක් සඳහා 700000.00
- ❖ කැබැල්ලෑව පුදුගලයන් 47 සඳහා 470000.00

- ඒකාබද්ධ ගොවි සංවිධානය  මාගල්ල ජලාශයේ කිරි ඉතිරීම් මංගල්‍ය පැවැත්වීම.
- ඉබ්බාවල, දිවුල්ලෑව. තරණගොල්ල. දිස්ත්‍රික් තරග සඳහා පරික්ෂණ පැවැත්විය.

**නේවාසික ව්‍යාපාර කළමණාකරු**

මේ වන විට වගාවේ ප්‍රගතිය ගොවි සංවිධාන මට්ටමින් විමසන ලදි. මේවන පිවිසුම් ඇළ බල ප්‍රදේශයේ සියළුම කුඹුරු වල වී වගාව 100% ක්ම වි වපුරා අවසන් කර ඇති බව පැවසීය.
මාගල්ල වැව යටතේ 2019.05.15 වන විට වී වපුරා අවසන් කළ යුතු බව දැන්විය. වගල් ප්‍රදේශ වල වී වැපිරීමට ප්‍රධාන ඇළ වසන තෙක් ප්‍රමාද කර ඇති බව ඉදිරි දින දෙක තුල වගාව අවසන් කරන බව ගොවිසංවිධාන ප්‍රකාශ කරන ලදි. මේ වන විට වගාවේ ප්‍රගතිය පහත පරිදි වේ.

- ❖ පිවිසුම් ඇල බල ප්‍රදේශය 100%

- ❖ මාගල්ලේගම 90%
- ❖ ඉබ්බාවල 95%
- ❖ මැදඇල 95%
- ❖ බලගොල්ලාගම 75%
- ❖ දණ්ඩුවාව 90%
- ❖ තරණගොල්ල 90%

**<u>අමතර බෝග වගා ප්‍රගතිය</u>**

**<u>වගා කරන ලද බෝග අක්කර ප්‍රමාණය</u>**

| ගොවි සංවිධානය | උදු | රටකජු | මුං | කව්පි | මිරිස් | වී | තල | කුරක්කන් | එලවළු | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| දිවුල්ලෑව ගොවි සංවිධානය | 31 | 25 | 01 | **02** | **02** | **50.0** | **01** | **01** | **03** | **116** |
| හීලෝගම ගොවි සංවිධානය | **20** | **02** | **05** | | | **07.5** | | | | **34** |
| කැබැල්ලෑව ගොවි සංවිධානය | **98** | **26** | **8.52** | **4** | | **33 .5** | | | | **170** |
| බුදුමුත්තාව ගොවි සංවිධානය | **203** | **28** | **8** | **0.5** | | **59.5** | | | | **298.5** |
| එකතුව | **352** | **81** | **22.5** | **6 .5** | **02** | **149 .5** | **01** | **01** | **03** | **618.5** |

**<u>නේවාසික ව්‍යාපාර කළමණාකරු</u>**

අමතර බෝග වගාව ලෙස සෝයා බෝංචි වගාව සඳහා ජ්ලෙන්ට් ෆුඩ් ආයතනය මැදිහත් වීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති බැවින්, ඒ සඳහා කැමැත්තක් දක්වන ගොවි මහතුන් හට එම වගාව පිළිබඳව දැනුවත් කිරීමට යොමු කළහැකි බවත්, අතිරේක බෝග වගාව මෙතෙක් නොකරන ලද ඉඩම්වල ගොවීන් මේ සඳහා මැදිහත් කරන ලෙසත් ගොවි සංවිධාන වෙත දන්වන ලදී.

**<u>ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු - නිකවැරටිය</u>**

2019/05/16 දිනට ජලාශයේ ජල ධාරිතාවය උස අඩි13 අඟල් 5 ක් වන අතර එය අක්කර අඩි 4709 ක් බව ප්‍රකාශ කරන ලදී. වර්ෂාව හේතුවෙන් පිවිසුම් ඇලට ගස් කඩා වැටීම නිසා තවමත් එය සුද්ද කරමින් පවතින බවද පැවසීය.

මේවන විට දකුණු මහ ඇලේ නඩත්තු කටයුතු කරගෙන යන බවද පැවසීය. අමතර බෝග වගාව සඳහා සෝයා බෝංචි වගා කිරීමට කැමැත්තක් දක්වන ගොවි මහතුන් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ වී උපදෙස් ලබා ගැනීමට හැකියාව ඇති බවද පැවසීය. ඒ සඳහා අවශ්‍ය ජලය ලබා දීමට හැකියා ඇති බවද දැන්වීය.

කඩිගාව හා නම්මුවාව නිරාලියද්ද යන ගොවිසංවිධාන ඉදිරියේදී මහා වාරිමාර්ග ව්‍යාපාරයට පවරා ගැනීම කළයුතු බව පැවසීය. නම්මුවාව කඩිගාව දක්වා ඇල මාර්ගය කඩිනමින් සුද්ද කිරීමේ කටයුතු කළයුතු බවත් ඒ සඳහා අදාල ගොවි සංවිධාන වගකීම ගෙන එම කටයුත්ත කලයුතු බවත් දන්වන ලදි.

| **ගොවිසංවිධානය** | **ගැටළුව** | **තීරණය** | **වගකීම** | **කාලය** |
|---|---|---|---|---|
| තරණගොල්ල දණ්ඩුවාව ගොවිසංවිධාන | කුඩාඔය සම්බන්ධව බැම් දෙකක් සකස් කරදෙන ලෙස ලිපියක් මගින් ඉදිරිපත් කරමින් එය ඉදිකර දෙන ලෙස ඉල්ලීමක් කරන ලදි. | ඇස්තමේන්තු සකස් කර අනුමැතිය සඳහා යොමු කිරීම. | වා: :දෙ: | ජුනි 30 ට පෙර |
| ගරු සභාපති | මාගල්ල වැවේ වාන් දොරටු නොමැති | වැව් බැම්ම | වා: :දෙ: | 2019 |

| | | | | |
|---|---|---|---|---|
| ඒකාබද්ධ ගොවි සංවිධානය | බැවින් වැඩි ජලය පිට කිරීම සඳහා වාන් දොරටු ඉදිකිරීම සඳහා යෝජනා කරන ලදි. | ශක්තිමත්ව නවීකරණය කර ඇති බැවින් වාන් දොරටු අවශ්‍යතාවය පරීක්ෂා කර බලා ඉදිරියට කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව පැවසීය. | | වර්ෂය තුල |
| ගරු ලේකම් දණ්ඩුවාව ගොවි සංවිධානය | දණ්ඩුවාව පාර සකස් කිරීමේදී පාර දෙපස අඩි 2 ක් බොරළු දමා සකස් කර දෙන ලෙස ඉල්ලීමක් කරන ලදි. | එය අවශ්‍යතාවය පරිදි සකස් කර දීමට එකඟ විය. | වා: :දෙ: | කාලය මාස 1 |
| ගරු සභාපති ඒකාබද්ධ ගොවි සංවිධානය | නෙළුම් වැවට යාමට පාරක් නොමැති බවත් නෙළුම් වැවට යාමට මාර්ගයක් සකස් කර ගැනීමට බට 6ක් ලබා දී පාර සකස් කර දෙන ලෙස ඉල්ලීමක් කරන ලදි. | 60 කෙත් ඇල හරහා පාර සකස් කර දීමට එකඟ විය. | වා: :දෙ: | ජුනි 30 |
| කඩිගාව නම්මුවාව ගොවි සංවිධානය | අක්කර 150 පමන වගා කර ඇති බැවින් ජල මුරයක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කරන ලදි. | කන්න රැස්වීම්වලට අනුව අමතර බෝග සඳහා දින 10 කට වරක් ජලය ලබා දෙන බැවින් එම කාලය තුලදී. ජල මුර වලදී ජලය ලබා දිමට තීරණය කරන ලදි.මේ සඳහා ගොවි සංවිධාන විසින් ඇලවේලි සුද්ද කර ගත යුතු බවත් තීරණය කරන ලදි. | වා: :දෙ: | |
| නේවාසික ව්‍යාපාර කාර්යාලය | මහ සභා තිරණවලට පටහැනිව අත ඉතිරි මුදල් ලඟ තබා ගැනීම. | මහ සභා තීරණවලට අනුව අත ඉතිරි මුදල් තබා ගැනීම ඒ සඳහා ලිඛිතව ගොවි සංවිධාන දැනුවත් කිරීම. | ගො:සං: | මැයි සිට |

**<u>ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු - නිකවැරටිය</u>**

මාගල්ල වැවේ වැ කන්දට මායිම්ව අනවසරයෙන් පොලිසිය අසල ඉදිකර තිබු වැට ඉවත් කල බව පැවසීය.

**<u>ලිපි ඉදිරිපත් කිරීම</u>**

යල් කන්නයේ ජලකළමනාකරණය පිළිබඳව වඩාත් සැලකිලිමත් වන ලෙසත් ජලය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම පිළිබඳවත් යල් කන්නයේ ජල භාවිතය පිළිබඳ තොරතුරු ලබා දෙන ලෙසත් වාරිමාර්ග කළමනාකරණ අංශයේ අධ්‍යක්ෂ විසින් යොමු කරන ලද ලිපිය ඉදිරිපත් කල අතර එමගින් ඉල්ලා ඇති තොරතුරු ලබා දෙන ලෙස ගොවි සංවිධාන දැනුවත් කරන කරන ලදි.

**<u>කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර - ගොවිජන සේවා මධ්‍යස්ථානය නිකවැරටිය</u>**

වී වගා කරන ගොවි සංවිධාන සඳහා පොහොර ලබා දීමට කටයුතු කරන බව පැවසීය. කැබැල්ලෑව ගොවි සංවිධානයේ අක්කර47 සඳහා පොහොර ඉල්ලුම්කර ඇති අතර අමතර බෝග වගා ප්‍රදේශ වලින් ඉතා සුළු බිම් ප්‍රමාණයකට පොහොර සහනාධාරය ඉල්ලා ඇති අතර එම ප්‍රදේශවලටද අභස්දිය නිර්දේශ යටතේ පොහොර ලබා දීමට කටයුතු කරන බව පැවසීය.

**<u>නේවාසික ව්‍යාපෘති කළමණාකරු</u>**

අද දින පවත්වන ලද ව්‍යාපාර කමිටු රැස්වීම සාර්ථක කර ගැනීමට සහයෝගය ලබාදුන් සියළුම රාජ්‍ය නිලධාරීන්ට හා ගොවි සංවිධාන නිළධාරීන්ට ස්තුතිය ප්‍රකාශ කරමින් ව්‍යාපාර කළමණාකරණ කමිටු රැස්වීම නිමා කරන ලදි



ආර්.එම්. රාජරත්න
නේවාසික ව්‍යාපාර කළමනාකරු
රිදීබැඳි ඇල ව්‍යාපාරය